


ආරණ්‍ය සේනාසනයට යන මග අමන්දි සිතුවාට වඩා දුෂ්කර එකක් විය. ඒ බව ඇගේ මුහුණින් විශ්වට තේරුම් යන්නට ඇත. ඇයට අපහසුවක් නොදැනෙන සේ වල ගොඩැලි සහිත මාර්ගය ඔස්සේ සිය වාහනය සීරුවෙන් පදවන්නට ඔහු මහත් වෑයමක් ගත්තේ ය.

"මේ පාරෙ නිතර වාහන යන්නෙ නැහැ.. ආරණ්‍යයෙ වැඩකට යන වාහනයක් විතරයි ඉඳ හිට යන්නෙ... ඒ නිසා මේක හදන්න කාටවත් ඒ හැටි ඕනෙකමක් නැහැ.." ඔහු කීවේ ය.

අමන්දි මේ ගමනට කැමැති වේ යයි විශ්ව නොසිතුවේ ය. බොහෝ වේලාවක් කඳුළු සළමින් සිටි ඈ ඔහු කළ යෝජනාවට සිය කැමැත්ත ප්‍රකාශ කළේ ඔහු බලාපොරොත්තු නොවූ මොහොතක ය.

"ඔයා කියනව නම් අපි ඒ ගමන යමු.."

ඒ මොහොත විශ්වජිත් ගේ සිත අමන්දානන්දයට පත් කළ මොහොතක් විය. ඔහු ඇගේ දෝතම තම දෝතින් සිර කරගත්වන ම ඈ දෙස බලා සිටියේ කඳුළින් තෙත්ව ගිය දෙනෙත් වලිනි. කියන්නට බොහෝ දේ සිතට ආ නමුත් ඒ කිසිවක් නොකියා ඔහු ඇගේ දෙනෙත් තුළට එබී බලාගත්වන ම බොහෝ වේලාවක් සිටියේ ය. ඔහුගේ කඳුළින් බර වූ දෑස ඒ කාලය තුළ ඇයට මහ දිග කතාවක් කීවේ ය. ඔහුගේ නිහඬ වදන් තම සිත පතුලත තිර ලෙස විසල් බරකින් යුතුව තැන්පත් වනු අමන්දිට දැනුණි. ජීවිතයට ආදරය කළ යුතුය.

ජීවිතය අතැර දා සිටි අමන්දි නැවත වතාවක් ජීවිතය සොයා යාමට තීරණය කර ඇත යන සිතුවිල්ල උපේක්ෂාවෙන් දරා සිටින්නට විශ්ව උත්සාහ ගනිමින් සිටියේ ය. මේ ඇය කැමැත්තෙන් දුන් එකඟතාවක් නොවන බව ඔහු දැන සිටියේ ය. එසේ වුවද මේ කුඩා ඉඩ ප්‍රස්ථාව විසල් වපසරියක් කරා ගෙන යන්නට තමාට හැකි වනු ඇති බවට ඇති ව තිබූ දැඩි විශ්වාසය විශ්ව ගේ සිතේ ඇති කළේ විසල් තෘප්තියකි.

කිසිවකු විසින් පවරාදෙනු ලැබූ වගකීමක් ලෙස එක සිතින් තමා මේ දරමින් සිටිනා ව්‍යායාමය හුදෙක් අමන්දි වෙනුවෙන්ම වූ එකක්ද නැත්නම් තමාගේ ද ආත්මාර්ථය වෙනුවෙන් වූ එකක්දැයි මේ සියල්ල අතරේ දී ඔහු ගේ යටි සිත ප්‍රශ්න කරමින් සිටියේ ය.

බැහැරින් සිට බලා සිටින සියල්ලම තීරණය කරනු ඇත්තේ මෙය ආත්මාර්ථකාමී උත්සාහයක් ලෙස බව අද උදෑසන ශාමිලා දුන් දුරකතන ඇමතුම පසක් කළේ ය.

"..මේ මැරෙන්න යන ගෑනියක් පස්සෙ අන්ධයෙක් වගේ දුවලා සර් හැම දෙයක්ම අවුල් කරගන්නවා... මට ඒකට දුකයි.. ඉස්සර සර් චිත්‍රයක් අඳිනකොට මං ළඟ ඉඳන් බලා ඉන්නවා.. හරිම ආසාවෙන්.. සර් අඳින දිහා බලා ඉඳලා අපිත් යමක් ඉගෙන ගන්නවා.. ඒත් සර් අර මනුස්සයගෙ පින්තූරෙ ඇන්දට පස්සෙ අද වෙනකල් කිසිම පේන්ටිං එකක් කළේ නැහැ.. දැන් මාස කීයක් ද..?" ශාමිලා කෙළින්ම කීවා ය.

එවදන් විශ්ව ගේ හදවත පිහි තුඩකින් සූරන්නාක් මෙන් වූ වේදනාවක් ඇති කළේ ය.

***මේ මැරෙන්න යන ගෑනියක් පස්සෙ අන්ධයෙක් වගේ දුවලා සර් හැම දෙයක්ම අවුල් කරගන්නවා... මට ඒකට දුකයි..***

ඔහු කල්පනා කරමින් සිටියේ එනිසා ය.

"මේ තරම් පටු විදිහට මේ දිහා බලන එක වැරදියි.." ඔහු පිළිතුරු දුන්නේ සෑහෙන වේලාවකට පසුව ය. "..මේ ලෝකෙ හැම මනුස්සයෙකුටම යුතුකමක් තියෙනවා තවත් කෙනෙක් වෙනුවෙන් කළ හැකි යමක් තියෙනවා නම් ඒ වෙනුවෙන් පොඩි හෝ කැපකිරීමක් කරන්න.. යම් කැපකිරීමක් කරනකොට පුද්ගලික දේවල් අතපසු වෙනවා තමයි.. මං මේ කරන්නෙත් අන්න ඒ වගේ කැපකිරීමක්. ඒ උත්සාහය අමන්දි පස්සෙ අන්ධයෙක් වගේ දුවනවා කියන තැනකට පහළට දාලා හිතන්න එපා.."



"මාත් කැමතියි සර් කියන විදිහට හිතන්න.. එහෙම හිතන්න පුලුවන් නම් අවුරුදු ගාණක් සර්ගෙන් ඉගෙනගන්න එන මට ඒක ලොකු සහනයක් වෙයි.. ඒත් කවුරුත් ඒක විශ්වාස කරන එකක් නැහැ සර්.. හැමෝම හිතන්නෙ මං කලින් කිව්ව විදිහටම තමයි.."

"කමක් නැහැ ශාමිලා... එක එක අය හිතන්නෙ තමන්ගෙ බුද්ධියෙත් පරිකල්පනයෙත් දිග පළල අනුවනෙ.. ප්‍රශ්නයක් නැහැ.. මම මං කරන කියන දේකට වෙනින් කවුරුත් කියන හිතන දෙයක් කවදාවක් බාධාවක් කරගෙන නැහැ.. හෙටත් ඒක එහෙමමයි ශාමිලා.. මට ආපහු හැරෙන්න බැහැ.."

එවර කල්පනා කිරීමේ වාරය ලැබී තිබුණේ ශාමිලා ට ය.

"මොකක් වුණත් කමක් නැහැ සර්.. මේ කතාවෙ අන්තිමේ සර්ට මොනවා වුණත් සර්ගෙ හොඳම ගෝලයෙක් විදිහට මං සර් ළඟ ඉන්නවා.. පරිස්සමින් වැඩ කරගන්න.. බුදු සරණයි.." ඒ දිග කල්පනාවෙන් පසු ශාමිලා දුරකතනය විසන්ධි කරන්නට පෙර කී හැටි විශ්වට තවමත් මතක ය.

විශ්ව හා එකඟ වීම නිවැරදි තීරණයක්දැයි දෙගිඩියාව විසින් අමන්දි නිහඬ කරනු ලැබ තිබුණි. ඒ තීරණය තවමත් සිතට වද දෙයි. ජීවිතය පිළිබඳව නිමන්තට තම සිතේ දල්වන්නට නොහැකි වූ ආශාව මේ සුන්දර මිනිසා විසින් දල්වනු ලැබුවේ කෙලෙසදැයි තේරුම් ගන්නට ඇය උත්සාහ දරමින් සිටියා ය. මහත් වැර වෑයමින් ගලවා දමනු ලැබ තිබූ ජීවිතය නම් වන හැව තුලට තමා නැවත වතාවක් රිංගා ගන්නට යන්නේය යන හැඟීම ඇගේ සිතට දරා ගත නොහැකි තරමේ බරක් ඇතුළු කර තිබුණි. විශ්වජිත් විසින් විසුළුණ ලද ආදරයත් කරුණාවත් කැපවීමත් තවත් තේරුම් ගත නොහැකි ආකර්ශනීය ගති පැවතුම් සියල්ලත් විසින් ජීවිතය හැර යාමේ තමාගේ මුරණ්ඩු සිත දමනය කර ඇති බව ඇයට දැනෙයි.

ජීවිතය කෙරෙහි නැවත වතාවක් ලෝභයක් ඇති වන්නේ විශ්වයක් සේ සුවිසල් ලොවක් තමා ඉදිරියේ බිහි කළ මේ මිනිසා කෙරෙහි බැඳුණා වූ සිත නිසා නොවේ ද..? මේ තවත් ව්‍යාසනයක ආරම්භය විය නොහැකි ද?

නිමන්ත අතින් පහසුවෙන් අතහැරී ගිය තම ජීවිතය අගාධය කරා ඇදී යන්නට නොදී ඇද බදා වැළඳගන්නට, ඒ ජීවිතයට අර්ථයක් සොයා දෙන්නට, මේ ගෞරවාන්විත සුන්දර මිනිසා කිසියම් පාරමිතාවක් පුරන්නට ඇතැයි අමන්දිට සිතුණි. මේ තවත් ව්‍යසනයක ආරම්භය නම් විශ්වජිත් වෙනුවෙන් ඒ සියල්ලට මුහුණ දෙන්නට ඇය සිත සාදා ගනිමින් සිටියා ය.

"මහන්සි නම් අපි ටිකක් ඉඳල යමු.." අමන්දි දෙස හැරී බැලූ විශ්වජිත් ඒ සමගින්ම රථය මාර්ගය අයිනට කර නැවැත්තුවේ ය. අමන්දි රියෙන් බැස්සා ය. පසුපස ආසනයේ වූ ගමන් මල්ලෙන් වතුර බෝතලය ගත් විශ්ව එයින් වීදුරුවක් පුරවා ඇය අත තැබුවේ ය.

"දුර වගේ දැනුණාට පාර ඒ තරම් දුර නැහැ.. දැන් ළඟයි.." ඔහු කීවේ ය. ඇය සිනාසුණා ය.

වරින් වර වැටෙන සිරි පොදය නිසා තෙත බරිත වී තිබූ තුරු වදුළු අතරින් ඇසුණේ රැහැයියන්ගේ නොනවතින ගීතය පමණකි. අමන්දි මෝටර් රථයේ බොනට්ටුවට වාරු වී දෑස් පියාගත්වන ම ඒ හඬට කන්දී සිටියා ය. පිරිසිදු වාතයේ නැවුම් සුවඳත් සන්සුන් පරිසරයත් තම සිත නිවාදමන්නා සේ ඇයට දැනුණි. බොහෝ වේලාවකට පසු ඇය දෑස් හැර ඔහු දෙස බැලුවේ ය. අනිමිසලෝචනයෙන් තමා දෙස බලා සිටිනා ඔහුගේ දෑස ඇගේ දෑස හා ගැටුණි. ඈ දිගුකළ දෑත් ඔහු සිය දෑතින් අල්ලා ගත්තේ ය.

"විශ්ව... තැන්ක් යූ සෝ එච්රි තිං.." අමන්දි ඔහුගේ දෑස් දෙස බලාගත්වන ම සිහින් හඬින් කීවා ය. "..මට ජීවත්වෙන්න ඕනෙ විශ්ව.."

"අපි හැම දෙනාටම නියම වෙච්ච ඩෙස්ටිනේෂන් එකක් තියෙනව අමා.. අපි එතන්ට යන්න ඕනෙ පරාජිතයන් හැටියට නෙවෙයි.. ජයග්‍රාහකයන් හැටියට.. ඒක ඔයාට තේරුම් කරදෙන්නයි මට ඕනෙ.. තරගයකින් තොරව පරාජය බාරගන්න මට මගේ ජීවිතය උගන්නලා නෑ අමා.. පැරදුණාට කමක් නැහැ.. අපි තරගයක් දුන්නා නම්.. ඒත් අත් දෙක බැඳගෙන